# විදේශීය වෙළෙඳුන්ගේ සංස්කෘතිකමය සිතැඟියාවන් ලාංකේය ආරාමික වාස්තුවිද්‍යාව තුළින් විමර්ශනය කිරීමක් (අම්පාර දිස්ත්‍රික්කය හා තදාසන්නව පිහිටි විහාර කීපයක් ඇසුරින්)

බී.එම්.ඒ. දනන්ජිත්

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
anjuladananjith20@gmail.com

**මුඛ්‍ය පද** - විදේශීය වෙළෙඳාම, ආරාමික වාස්තුවිද්‍යාව, මහායාන සංකල්පය, අවලෝකිතේශ්වර

## හැඳින්වීම

ශ්‍රී ලංකාව දූපත් රාජ්‍යයක් වීම හේතුකොටගෙන අතීතයේ දී ගෝලීය ආර්ථික, දේශපාලනික, සංස්කෘතික ක්ෂේත්‍රයන්හි බලපෑම මෙරටට ලැබුණු බව ඓතිහාසික සාධක විමර්ශනයේ දී පෙනී යයි. එම ක්ෂේත්‍රයන්හි බලපෑම හේතුකොටගෙන මෙරටට ලැබුණු දායාදයන්හි නෂ්ටාවශේෂ දැනුදු දක්නට ලැබේ. එම දායාදයන් වෙනුවෙන් වැදගත් දායකත්වයක් විදේශීය වෙළඳුන් විසින් සිදුකර ඇත. මොවුන් විසින් සිය ආර්ථික අරමුණු මුදුන් පමුණුවා ගන්නා අතරේ ම ආගමික, සංස්කෘතික නියෝජිතයින් වශයෙන් ද ක්‍රියාකර ඇත. ඔවුනගේ සිතැඟියාවන් මෙරට ආරාමික වාස්තුවිද්‍යාවට කෙසේ සම්මිශ්‍රණය වූයේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා වන මෙම අධ්‍යයනය අම්පාර දිස්ත්‍රික්කය හා තදාශ්‍රිතව පවත්නා සියඹලාණ්ඩුව - මානාභරණ විහාරය, පොතුවිල් - මුහුදු මහා විහාරය, ශාස්ත්‍රවෙල - මණිනාග විහාරය, ලාහුගල - මඟුල් මහා විහාරය යන විහාර ආශ්‍රය කොටගෙන සිදුකරයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන සහ මූලාශ්‍ර පරිශීලනය මත පදනම් ව අධ්‍යයනයන් සිදු කර ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසින් පසුව එවකට ග්‍රීසිය, රෝමය සහ අරාබිකරය වෙත තිබූ ගෝලීය ආර්ථික ආධිපත්‍යය ක්‍රමයෙන් චීනය ඇතුළු නැගෙනහිර හා අග්නිදිග ආසියාව වෙත ගමන් කිරීම තුළ එම කලාපවල මුල් බැස තිබූ සංස්කෘතික, ආගමික අදහස් හා සංකල්ප පෙර අපර දෙදිග යා කරන මධ්‍යස්ථානයක් වූ ශ්‍රී ලංකාව වැනි රාජ්‍යයකට ලැබීම සිදුවිය හැකිය. මෙකී සංකල්පයන් අධ්‍යයනයට බඳුන්වන විහාරවල වාස්තුවිද්‍යාව හා සම්මිශ්‍රණය වී ඇත්තේ මෙරටට පැමිණි වෙළඳුන්ගේ අනුග්‍රහයන් මත ය. ලංකාවේ නැගෙනහිර වෙරළාශ්‍රිතව ඉදි වී ඇති පොතුවිල් මුහුදු මහා විහාරය එලෙස ඉදි වූ විහාරයක් ලෙස උපකල්පනය කළ හැකිය. මෙහි දැනට මතු කර ඇති පිළිමගෙය තුළ බුද්ධ ප්‍රතිමාවක් හා බෝධිසත්ව ප්‍රතිමා දෙකක් දක්නට ලැබේ (ඵලක 01). මේවා නාවුක ගමනාගමනයේ යෙදුනවුන්ගේ අභිලාෂයන් මත වෙරළාශ්‍රිතව ඉදි වී ඇත. සියඹලාණ්ඩුව මානාභරණ විහාරයේ මෑතකදී සිදුකළ කැණීමකදී හි දාගැබ තුළින් තාරා දෙවඟනගේ ප්‍රතිමාවක් අනාවරණය වී ඇත (ඵලක 02).



ඵලක 01 - මුහුදු මහා විහාරයේ බුද්ධ හා බෝධිසත්ත්ව ප්‍රතිමා



ඵලක 02 - මානාභරණ විහාරයෙන් හමුවූ තාරා දෙවගන ප්‍රතිමාව


ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත විහාරය එහි පිහිටීම නිසා ම සුවිශේෂ වේ. මෙම විහාරය හැඩඔයේ ප්‍රධාන අතුගංගාවක් වන කුඩා කල්ලුව මෝය කට ආසන්නයේ නෙරාගිය ගල් පර්වත සහිත භූමියක පිහිටුවා ඇත. එහි අඩි 30ක පමණ විෂ්කම්භය සහිත චෛත්‍යය ගොඩැල්ල සහ විහාරයට අයත් දැනට Crocodile Rock ලෙස හඳුන්වන වෙරළාසන්නයේ පිහිටි විශාල පර්වතයෙහි සීඝ්‍ර බෑවුම මත පිහිටි දාගැබ් තුනකි. මෙම දාගැබ් තුන එකම රේඛාවක පිහිටා ඇති අතර අතීතයේ සාගරයේ යාත්‍රා කළ නාවිකයන්ට මං සලකුණු පෙන්වා දෙන ලද ප්‍රදීපාගාරයක් වශයෙන් ක්‍රියාත්මක වන්නට ඇත. අතීතයේ සාගරයෙහි නෞකා ගමනාගමනයේ යෙදෙන නාවිකයන් මෙන්ම වෙළඳුන් සිය නෞකා යාත්‍රා කරවනු ලැබුවේ ගොඩබිම පෙනෙන මායිමක සිට ය. දිශාවන් සොයා ගැනීමේ අපහසුතාවය නිසාවෙන් ගැඹුරු සාගරය වෙත යාත්‍රා කිරීම තාක්ෂණික වශයෙන් ගැටලු ඇතිකිරීම මීට හේතුවයි. එම නිසාවෙන් ගොඩබිම පවත්නා සලකුණු ඔස්සේ සිය යාත්‍රාවන් ගමන් කරවීම වඩාත් ප්‍රතිඵලදායක වේ. එබැවින් ලංකාවේ නැගෙනහිර වෙරළාසන්න ව පැවැති පැරණි විහාරවල දාගැබ් නාවුක ගමනාගමනයේදී වැදගත් මංසලකුණු පෙන්වන සංඥාවක් වශයෙන් උපකල්පනය කළ හැක. ඒවායෙහි පවතින උපයෝගීතාවය ආගමික සන්දර්භයෙන් ඔබ්බට ගිය වෙළඳ අරමුණක් වූ නිසාවෙන් අතීතයේ වෙළඳුන් සහ නාවිකයන් මෙම විහාරවලට අනුග්‍රහය දැක්වූ බව උපකල්පනය කළ හැක.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට මුහුණලා තිබූ රාජ්‍යයන් ආර්ථික වශයෙන් පිබිදී එන විට මෙරට නැගෙනහිර වෙරළින් මුහුදට වැටෙන ගංගාවල මෝය ආශ්‍රිතව මධ්‍ය හා කුඩා පරිමාණයේ නැංගුරම්පොලවල් පැවතී ඇත. මේවට පැමිණෙන වෙළඳ නැව් ගංගා මෝය අසල නවතා තබා එතැන් සිට ගංගාවන් ඔස්සේ ඉහළට කුඩා යාත්‍රා මඟින් අභ්‍යන්තර වෙළඳාම සිදුකරන්නට ඇත. නිදසුනක් වශයෙන් කුඹුක්කන් නදිය හෙවත් අතීත කාම්බෝජ නදිය ඇසුරු කොට කටයුතු කළ කාම්බෝජ වෙළෙඳ ශ්‍රේණියක් පිළිබඳ තොරතුරු බෝවත්තේගල විහාරයෙන් හමුවීම දැක්විය හැක. එසේ සිදුකරන ලද්දේ ගොඩබිමින් ගමන් කිරීමට වඩා ජලයෙන් ගමන් කිරීම ලාභදායී වීමත් අනතුරු අඩු වීමත් නිසාවෙනි. මෙලෙස ගමන් කිරීමේදී හමුවන විහාරයන් සඳහා වෙළඳුන් විසින් අනුග්‍රහයන් ලබා දී ඇත. මෙයට සමාන උදාහරණයක් අග්නිදිග ආසියාවේ ලබාගත හැකිය. බුරුමයේ ඉරවඩි ගංගාව ඉහලට එකල වෙළෙඳුන් ගමන් කර ඇති අතර ඔවුනගේ අනුග්‍රහය මත පගාන් ඇතුළු සිද්ධස්ථාන 3000ක් පමණ ඉදිවී ඇත. ඉන්දුනීසියාවේ ප්‍රෝගෝ ගඟ ආශ්‍රිතව බොරෝබුදූර්, චනිමෙන්ඩු, චන්දිපවන් ආදී විහාර එලෙස නිර්මාණය වූ විහාර වේ.

ඉහත දී දක්වන ලද විහාරයන්හි වාස්තුවිද්‍යාත්මක අංග ලක්ෂණ තුළ බහුලවම දක්නට ලැබෙන්නේ මහායානික වාස්තුවිද්‍යාත්මක සංකල්ප ය. මානාභරණ විහාරයෙන් අනාවරණය වන තාරා දෙවඟන පිළිරුවත්, මුහුදු මහා විහාරයේ අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාත් ක්‍රිස්තු වර්ෂ 5-7 සියවස්වලින් පසු නැගෙනහිර, අග්නිදිග ආසියාතික රාජ්‍යයන් සහ බෙංගාල බොක්ක කලාපයේ වෙළෙඳුන්ගේ සංස්කෘතිකමය අදහස් ප්‍රකට කරවයි. එවකට එම කලාපවල වඩාත් ප්‍රබල ලෙස ගොඩනැගුණු මහායානික සංකල්පවල එන අවලෝකිතේශ්වර, තාරා යන දේව චරිත මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ එන දුක්කරදරවලට පිහිට වන මහා කරුණාවෙන් යුතු චරිතයන් ලෙස එකල ප්‍රසිද්ධ ව පැවතිණ. නාවිකයන් සහ වෙළෙඳුන් යනු වඩාත් දුෂ්කර, අවදානම් සහිත සාගර සහ ගොඩබිම් ප්‍රදේශවල ගමන් කරන පිරිස් ය. ඔවුනට අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් පිහිටවන බවට විශ්වාස පැවතිණ. අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ශක්තියක් වන තාරා දෙවගන නාවිකයන්ට පිහිටවන "නාවිකී" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වා තිබීම තුල මෙම කරුණ සනාත වේ.

මෙම වෙළෙඳුන් හරහා ඔවුන්ගේ සංස්කෘතික සංකල්ප ශ්‍රී ලංකාවේ නැගෙනහිර සහ දකුණු ප්‍රදේශවල බහුලව ව්‍යාප්ත වී ගොස් ඇත. ඊට අනුකූල වූ ආරාමික වාස්තුවිද්‍යාත්මක රටාවක්

නිර්මාණය වී තිබෙන බව පැරණි විහාර ගණනාවක පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය තුළින් පෙනී යයි. පංචාවාස විහාර සැලැස්ම එවන් ආරාමික සැලැස්මකි. මේ අනුව නිර්මාණය වූ ලාහුගල මඟුල් මහා විහාරය මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ එන හස්ත්‍යාරාම සැලැස්මට අයත් වේ (ඵලක 03).




ඵලක 03 - මඟුල් මහා විහාරයේ ආරාම සැලැස්ම

එසේම මෙම විහාරයේ බුදුබව පතා සිදුකළ ප්‍රදානයන් පිළිබඳව ද සඳහන් වේ. මෙම බුදුබව පැතීමේ සංකල්පය මහායානික සංකල්පයක් වේ. මෙම සංකල්පයන් මෙරටට පැමිණියේ වෙළෙඳුන් හරහා ය.

භූගෝලීය වැදගත් පිහිටීම හේතුකොටගෙන එවකට පැවැති ගෝලීය ආර්ථික හැසිරීම් මත විවිධ වූ ආගමික, සංස්කෘතික අදහස් හා සංකල්ප මෙරටට පැමිණි බවත්, එම සංකල්පයන් පැරණි ආරාමික වාස්තුවිද්‍යාව කෙරෙහි සම්මිශ්‍රණය වූ බවත් බවත්, එහිදී මහායානික අදහස්වල වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබෙන බවත් පරීක්ෂාවට බඳුන්කළ විහාරයන්හි වාස්තුවිද්‍යාව අධ්‍යයනයෙන් පෙනී යයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**


ගම්ලත්, ඩී., (2018), ***අතීත රෝහණ රාජධානියේ සංඝාරාම හා සබැඳුනු ඓතිහාසික විවරණයක්,*** The Journal of Archaeology and Heritage Studies volume 5-issue 2, Mihinthale: Department of Archaeology & Heritage Management Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka